**ශීර්ෂ 160 - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබද පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම්, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| ------ | --------------------------------- | -------------------------- |
| 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 2015.07.16 |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2015.07.03 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම්, අදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1. විසර්ජන ගිණුම්**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,304.27 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,497.29 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 785.27 ක් හා රු.මිලියන 21.7 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29.63 ක් හා සියයට 1.3 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 160 | 2,649.95 | 1,864.69 | 785.27 | 29.63 |
| 283 | 1,654.32 | 1,632.60 | 21.7 | 1.31 |
| **එකතුව** | **4,304.27** | **3,497.29** | **806.97** | **18.75** |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 2,060 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 789 ක ආදායම් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 37 ත් සියයට 83 අතර පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10:03:07:03 | 60 | 50 | 10 | 16.67 |
| 20:02:01:02 | 2,000 | 739 | 1,261 | 63.05 |
| **එකතුව** | **2,060** | **789** | **1,271** | **61.70** |

## 2.3 අත්තිකාරම් ගිණුම

## 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 16001 | 7.5 | 6.28 | 4.5 | 5.68 | 40.00 | 24.24 |
| 28301 | 60 | 41.45 | 48 | 62.20 | 301.00 | 217.00 |

## 2.4 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන10.48 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 7002/0000/00/0323/0014/000 | 0.52 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0045/0014/000 | 9.96 |
| **එකතුව** | | **10.48** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 24.77 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 6000/0000/00/0015/0070/000 | 6.16 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0138/000 | 18.61 |
| **එකතුව** | | **24.77** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3 ශීර්ෂ 160 - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

## 3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු රු.65,724,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 57 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.5,278,058 ක්වූ තැන්පතු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------------**

විෂය අංක 16001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබූණු ශේෂවල එකතුව රු.329,983 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 15 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

කාර්යාල උපකරණ හා වෙනත් අයිතම 71 නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්, ව්‍යාපෘති ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.790,571,046 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.295,728,256 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබු ක්‍රියාකාරී සැලැස්මට අනුරූපී වන පරිදි කාර්යසාධන ප්‍රගති සමාලෝචන වාර්තාවක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඇගයීම් නිසි පරිදි සිදු කළ නොහැකි විය.

(ආ) ජාතික ඕසෝන් ඒකකය සම්බන්ධ විදේශාධාර ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන වාර්තාව හා ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් පරීක්ෂා කිරීමේදී මුදල් ඉතිරිවීම් අවස්ථා දෙකක් සහ ඉක්මවූ අවස්ථාවක් විය.

(ඇ) අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ පරිසර රසායන කළමනාකාරීත්ව ධාරිතා වර්ධන වැඩසටහන සඳහා සළසා තිබුණු රු.150,000 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම වැඩසටහන අත්හැර තිබුණි.

**3.7 කාර්යසාධනය**

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ඉටුනොකර හා ප්‍රමාණවත් ලෙස ඉටුනොකර හෝ තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) අටවිසි බෝධිපූජා වැඩසටහන් 45 ක් ක්‍රියාත්මක කිරීම සඳහ රුපියල් මිලියන 4 ක ප්‍රතිපාදන සළසා තිබුණද එයින් රු.65,350 ක් උපයෝජනය කර වැඩසටහන් 09 ක් පමණක් ඉටු කර තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම හා තථ්‍ය වියදම අතර සියයට 81.97 ක සිට සියයට 88.25 ක් දක්වා වූ පරාසයක විචලනයන් පැවැතුණි.

**(ආ) සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කළ යුතුව තිබුණු රු.186,225,000 ක් වූ කාර්යයන් 14 ක් ඉටුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ කාර්යයන් දෙකක් සඳහා රු.1,675,000 ක් වැය කර තිබුණි.

(iii) උක්ත සැලැස්මට අනුව කටයුතු නොකර කල්දමන ලද කාර්යයන් 2 ක් විය.

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පවිත්‍රකර සංවර්ධන යාන්ත්‍රණය පිළිබඳ ලේකම් කාර්යාලයක් පිහිටුවීමට සළසා තිබුණු රු.1,500,000 ක ප්‍රතිපාදනවලින් රු.378,000 ක් උපයෝජනය කර ආහාර සුරක්ෂිත බව කෙරෙහි දේශගුණ විපර්යාසවල බලපෑම් සහ අනුරූපී වීම පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය පවත්වා තිබුණි.

**3.9 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2010 වර්ෂයට පෙර පැවත එන රු.588,278 ක් වූ පාඩු හා අලාභහානි දෙකක් විය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් පාඩු හා අලාභහානිවලට අමතරව රු.25,000 ක් ඉක්ම වූ 2009 වර්ෂයේ සිට පැවත එන සිද්ධීන් 06 කට අදාළ එකතුව රු.882,675 ක පාඩු හා අලාභහානි විය.

**3.10 අනාර්ථික ගනුදෙනු**

-----------------------

පාරම්පරික දැනුම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා උපායමාර්ග සම්මත කර ගැනීමට නියමිත සැලැසුම් හෝ ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව රු.179,200 ක් වැය කර තිබුණද, නිවැරදි ජාතික ප්‍රතිපත්තියක් සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 24 | 31 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 34 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 183 | 119 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 76 | 47 | 29 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **353** | **225** | **128** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 128 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**4. ශීර්ෂ 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**4.1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛනය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | **ස්ථාවර වත්කම් ලේඛනය** | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) |
| (iv) | ඉකුත් වු තැන්පත් පිළිබඳ ලැයිස්තුව | මුදල් රෙගුලාසි 571 (1) |

**4.2 විගණන සාක්ෂි නොවීම**

මුදල් රෙගුලාසි 272(3) වගන්තිය ප්‍රකාරව කලාප කාර්යාල, දිසා වන කාර්යාල, කුඹල්පොල පර්යේෂණ මධ්‍යස්ථානය හා වන විද්‍යායතනයෙහි 2014 වර්ෂයට අදාළ ගෙවීම් වවුචර් ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 අයවැය විචලනය**

වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 78 සිට සියයට 11 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 4.4 ආදායම් ගිණුම්

---------------

### 4.4.1 20:02:01:02 දරන ආදායම් සංකේතය - රජයේ කැලෑවලින් ලැබෙන ආදායම

----------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 2,000 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 739 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 37 ක් වි තිබුණි. රාජ්‍ය දැව සංස්ථාවෙන් ලැබිය යුතු රු. මිලියන 1,056.38 ක ස්කන්ධභාග මුදල් නොලැබීම සමාලෝචිත වර්ෂයේ ආදායම අඩු වීමට හේතු වී තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රුපියල් මිලියන 1,060 ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් අතර කාල පරාසයකට අදාල විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 176(1) ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතයට අදාළ හිඟහිටි ආදායම් පිළිබඳ වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවේ ප්‍රධාන කාර්යාලයට අදාළ රු.මිලියන 458.31 ක හිඟහිටි ආදායම් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඈ) හිඟ ආදායම් වාර්තා පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය, කුඹල්පොල පර්යේෂණ ආයතනය හා වන විද්‍යායතනය ඇතුළු ආයතන 31කින් ආයතන 19 කින් පමණ ලබාගන්නා ලද තොරතුරු පදනම් කරගෙන හිඟහිටි ආදායම් වාර්තා පිළියෙල කර තිබුණි.

(ඉ) 2014 හිග ආදායමට ඇතුළත්ව නොතිබු රු.187,831 ක් 2015 ජනවාරි මාසයේදී ලැබී තිබුණි.

(ඊ) රාජ්‍ය දැව සංස්ථාවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ස්කන්ධභාග මුදල් සහ රාජ්‍ය දැව සංස්ථාවෙන් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල් අතර රු.92,091,958 ක වෙනසක් පැවැතුණි.

### 4.4.2 10.03.07.03 දරන ආදායම් සංකේතය - පුද්ගලික දැව ප්‍රවාහන ආදායම් ගිණුම

----------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ඉහත සඳහන් ආදායම් ගිණුමට ආදාලව රු.මිලියන 60 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය

අවසාන වන විට එම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 83 ක් හෙවත් රු.මිලියන 50 ක පමණ ආදායමක් රැස්කර තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.534,758 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් අතර කාල පරාසයකට අදාල විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර හිඟහිටි ආදායම් වාර්තා පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිසා වන කාර්යාල, කුඹල්පොල පර්යේෂණ ආයතනය හා වන විද්‍යායතනය ආදී ආයතන 31 කින් ආයතන 20 ක වාර්තා පදනම් කර ගෙන හිඟහිටි ආදායම් වාර්තා පිළියෙල කර තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ ජනවාරි මාසයේ ලැබීම් කුවිතාන්සි පරීක්ෂා කිරීමේදී හිඟ ආදායමට ඇතුළත්ව නොතිබුණු අතර 2014 වර්ෂයට අදාළව 2015 වර්ෂයේදී රු.168,536 ක ආදායමක් ලැබී තිබුණි.

## 4.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.8,778,940 ක්වූ අතර ඉන් රු.4,947,593 ක හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 4.6 පොදු තැන්පත් ගිණුම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ ප්‍රධාන කාර්යාලයට අයත් රු.1,562,363 ක්වූ තැන්පතු 60 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ විවිධ තැන්පත් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.12,538,867 ක් වුවද, විවිධ තැන්පත් ලේඛනයට අනුව එම ශේෂය රු.11,701,980 ක් විය. ඒ අනුව රු. 836,887 ක වෙනසක් විය.

**4.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

--------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එය 2015 මාර්තු 30 දින පිළියෙල කර තිබුණි.

(ආ) **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එය 2015 අප්‍රේල් 04 දින පිළියෙල කර තිබුණි.

**4.8 වත්කම් කළමනාකරණය**

------------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් අනාවරණය විය.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

--------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරිම**

-----------------------------------------------------

අමාත්‍යාංශ හා විවිධ ව්‍යාපෘති 10 ක් සතුව තිබුණු වාහන 49 ක් විධිමත් අනුමැතියකින් තොරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබු බව නිරීක්ෂණය විය.

**(ඇ) නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

මතුගම අඩවි වන කාර්යාලයේ නිල නිවාස ගොඩනැගිල්ලේ හොණ්ඩා යතුරු පැදි දෙක, සුසුකි වර්ගයේ හා Kinetee වර්ගයේ යතුරු පැදි දෙක අබලන්ව ගාල්කර තිබුණි. මෙම යතුරු පැදි අළුත්වැඩියා කර පාවිච්චියට ගැනීම හෝ පාවිච්චියට ගත නොහැකිනම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | අවස්ථා 09 කදී සිදු වී තිබුණු අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1647 | දෙපාර්තමේන්තුවේ ධාවනයේ යොදා තිබුණු සංචිත වාහන 343 ක දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා 2015 මාර්තු 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 4.10 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍ය ප්‍රදාන යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 771 ක් වී තිබුණු අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 187.72 ක් උපයෝජනය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියේ වේතන වෙනුවෙන් රු.389,621 ක් ඒකාබද්ධ වියදම් වාර්තාවට ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය සඳහා රු.29,756,748 ක් වැය කර වාහන 03 ක් මිලදී ගෙන තිබුණත්, එම වටිනාකම රු.9,918,916 ක් වැඩියෙන් ඒකාබද්ධ වියදම් වාර්තාවේ ඇතුළත් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩසටහන් 32 ක් පැවැත්වීමට රු.1,555,180 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් රු.1,529,878 ක් වැය කර වැඩසටහන් 21 ක් පමණක් පවත්වා තිබුණි. මෙම වැඩසටහන් සඳහා සහභාගී කර ගැනීමට බලාපොරොත්තු වූ හා තථ්‍ය වශයෙන් සහභාගී වූ අයගේ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 60 ක් අවසානයේදී ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට 39 ක් හෙවත් රු.මිලියන 304 ක් පමණක් වැයකර තිබුණි.

(ඉ) ව්‍යාපෘතිය සඳහා රු.6,783,873 ක් වූ වත්කම් මිලදී ගෙන තිබුණද , ව්‍යාපෘතිය වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර වාර්ෂික වත්කම් සමීක්ෂණයක්ද සිදු කර නොතිබුණි.

**4.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

---------------------------------------------------------------

මුලතිව් දිසා වන කාර්යාලයේ බැංකු ජංගම ගිණුම වෙනුවෙන් 2014 ඔක්තෝබර් සිට 2015 මාර්තු දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 අප්‍රේල් 10 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

--------------------------

බැංකු ජංගම ගිණුම් 05 ක් මගින් නිකුත් කරන ලද කල් ඉකුත් වූ එකතුව රු.23,786 ක් වටිනා චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව 2015 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.12 අවිධිමත් ගනුදෙනු

---------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ලීබඩු හා උපකරණ මිලදී ගැනීම**

-----------------------------------

වන සංගණන හා භූ විද්‍යා තොරතුරු අංශය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරව මාස 04 ක කාල පරාසයක් තුළ රු.102,474 ක් වටිනා ලී බඩු උපකරණ මිලදී ගෙන තිබුණි.

**(ආ) කළුතර දිසා වන කාර්යාලය විසින් මායිම් කණු මිලදී ගැනීම.**

---------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වන සංරක්ෂකගේ (වන විද්‍යා හා කළමනාකරන) 2014 ජුලි 23 දිනැති අංක: FM/මා/2014/නි.ක. දරන ලිපිය මගින් දිසා වන නිලධාරී කළුතර වෙත මායිම් කණු 1100 ක් නිපදවා ගැනීමට අනුමැතිය ලබා දි තිබුණි. එහෙත් එම උපදෙස්වලට පටහැනිව ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව මායිම් කණු නිෂ්පාදනය නොකරන ආයතන දෙකකින් ලංසු කැඳවා තිබුණි. 2014 අගෝස්තු 08 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදි එම ආයතන සතුව කම්කරුවන් හා කොන්ක්‍රීට් කණු නිෂ්පාදනයට සුදුසු ස්ථානයක් හෝ නොතිබුණි.

(ii) කළුතර දිසාවේ අගලවත්ත අඩවියේ වනාන්තර දක්වා මායිම් කණු ප්‍රවාහනය කිරීම සඳහා ලංසු කැඳවීමේදී නියමිත පරිදි තරඟකාරීත්වකින් හා විනිවිද භාවයකින් යුක්තව සිදු කර නොතිබුණි.

(iii) තවද ලංසු කැඳවීමේ ලිපියේ මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වටිනාකම ඉලක්කමෙන් පමණක් සටහන් කර තිබීම නිසා ඉදිරිපත් කරන ලද ලංසුවල සඳහන් මිල ගණන් වෙනස් කිරීමේ හැකියාව පවතින බවද, ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් වැඩිදෙනෙකු නොපැමිණි බවද හෙළි විය.

(iv) තවද ලෝක පරිසර දින සැමරුම් වැඩසටහන සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ලංසු කැඳවීමේදී බොහෝ ආයතන වෙත මිල කැඳවීමේ ලිපි රැගෙන ගොස් එම ආයතනවලට අදාල රබර් මුද්‍රා තබා අත්සන් ලබාගෙන මිල

ගණන් හිස්ව රැගෙනවිත් පසුව ඒවා සම්පූර්ණ කර මිල කමිටුවට ඉදිරිපත් කළ අවස්ථා තිබුණි.

**4.13 පාඩු හා හානි**

අලාභය රු.25,000 කට අඩු සිද්ධීන් 33 ක්ද, අලාභය රු.25,000 කට වැඩි සිද්ධීන් 62 ක්ද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. ඉන් සිද්ධීන් 68 ක් අලාභය සිදු වී වර්ෂ 10 කටත් වැඩි කාලයක් ගත වී තිබුණි.

**4.14 අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) **මොරපිටිය බීට්ටු වන නිලධාරී නිල නිවාසය අළුත්වැඩියාව**

මොරපිටිය බීට්ටු වන නිලධාරි නිල නිවසේ අලුත්වැඩියාව සඳහා රු.599,616 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා රු.600,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගෙබිම කොන්ක්‍රීට් කිරීම සඳහා වර්ග අඩි 200 ක් සඳහා ඇස්තමේන්තුවෙන් රු.33,710 ක් වෙන්කර තිබුණි. එහෙත් සත්‍ය වශයෙන් වර්ග අඩි 62 ක් පමණක් කොන්ක්‍රීට් කර තිබුණි. ඒ අනුව අධි ඇස්තමේන්තුව රු.23,260 ක් විය.

(ii) සිවිලිං තහඩු 35 ක් සඳහා රු.21,700 ක අධි ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

(iii) උළුවස්සක් සඳහා වර්ග අඩි 40 ක් සඳහා රු.20,800 ක් ඇස්තමේන්තු කර තිබුණද, භෞතික පරීක්ෂාවේදී එවැනි උළුවස්සක් සවිකර නොතිබුණි. ඒ අනුව අධි ඇස්තමේන්තුව රු.20,800 ක් වී තිබුණි.

(iv) දොරවල් සෑදීමට වර්ග අඩි 120ක් සඳහා රු.87,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී සවිකර තිබූ දොරවල් ප්‍රමාණය වර්ග අඩි 94 ක් බැවින් අධි ඇස්තමේන්තුව රු. 8,000 ක් වී තිබුණි.

(v) මෙම අලුත් වැඩියාව සඳහා පුහුණු කම්කරුවන් 63 හා නුපුහුණු කම්කරුවන් 86 ක් හා අනියම් කම්කරුවන් 63 ක් යොදවන බවට අධි ඇස්තමේන්තු කිරිමක් කර තිබුණි.

**(ආ) කළුගල් ඉවත් කිරීම - වැල්ලවාය අඩවි වන කාර්යාලය**

---

වැල්ලවාය අඩවි වන කාර්යාලය යටතේ පිහිටි රක්ෂිතවලින් කළුගල් කඩා ඉවත්කර ගැනීම සඳහා 2014 වර්ෂයේදී පුද්ගලයින් 18 දෙනෙකු හට අවසර ලබාදී තිබූ අතර නියැදියක් වශයෙන් ස්ථාන 4ක් පරීක්ෂාවට ලක්කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වැල්ලවාය අඩවි වන කාර්යාලයට අයත්වන කෝන් පැලැන රක්ෂිතයේ පිහිටි කලුගල්වලින් ගල් කඩා ගැනීමට සහ ඒ අසලම පිහිටුවා ඇති කළුගල් ඇඹරුම් ස්ථාන පවත්වා ගැනීමට අවසර ලබාදී තිබුණි. ඉන් තිදෙනෙකු විසින් ගල් ඇඹරුම් හල්ද ඒ ආසන්නයේ පවත්වාගෙන යමින් තිබුණි.

(ii) රක්ෂිතයන්හි පිහිටි කළුගල් කැඩීම සඳහා බලපත්‍ර ලබාදීමේදී හා කළුගල් කැඩීම ක්‍රියාත්මක කිරීමේදී අඩවි වන කාර්යාලය සුපරීක්ෂාකාරීව කටයුතු කර නොතිබුණි. මේ නිසා බලපත්‍ර ලබාගන්නා පුද්ගලයින් තමන්ට රිසිසේ රජයට මුදල් ගෙවීමකින් තොරව වනජ ද්‍රව්‍ය ඉවත් කර ගැනීම නිසා රජයට රු.3,588,600 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) වැල්ලවාය අඩවි වන කාර්යාලයට අයත් කොටිකම් බොක්ක රක්ෂිතයේ පිහිටා ඇති සුදු තිරිවානා නිධියෙන් (සිලිකා ගල්) ඉවත්කර ගැනීම සඳහා 2014 වර්ෂය සඳහා පුද්ගලයින් 9 දෙනෙකුට අවසර ලබාදී තිබුණි. මෙම තිරිවානා නිධිය හොඳින් ගස් වැවී ඇති, ගස් සහිත කන්දක පිහිටා තිබුණි. තිරිවානා කඩාගනු ලබන නිධිය පරික්ෂා කිරීමේදී ස්වාභාවික පරිසරයට බරපතල හානි සිදුවන බව අනාවරණය විය. 2014 වර්ෂයේ දි මෙම තිරිවානා නිදියෙන් තිරිවානා ඉවත් කර ගැනීමට බලපත්‍ර ලබාදීමේදී රජයට රු. 188,100 ක අලාභ සිදු වි තිබුණි.

## 4.15 විසඳා නොතිබුණු විගණන ඡේද

---

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද තුළින් පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2008 | 4.3(ආ) | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතුවල දුර්වලතාවය |
| 2009 | 4.3(ii) | |
| 2010 | 1.3(ඇ)(i) | |
| 2011 | 1.3(ඊ) | |
| 2012 | 1.3(ඉ) | |
| 2012 | 1.3(ඉ) | |
| 2010 | 1.21(ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| 2011 | 1.11(ක) | |
| 2013 | 1.6(අ)(iii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය පවත්වා නොතිබිම. |

## 4.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) මතුගම අඩවි වන කාර්යාලය අලුත්වැඩියා කිරීම**

මතුගම අඩවි වන කාර්යාලයට අයත් නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා රු.207,948 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම අළුත්වැඩියාව සඳහා රු.179,003 ක් වැයකර තිබුණි. වහලයේ කොටසක සිදු කළ යුතුව තිබුණු අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවක් නොසළකා හැර තිබුණි.

**(ආ) දැව ව්‍යාපාර ලියාපදිංචිය අළුත් කිරිම**

වග, අගලවත්ත, මතුගම සහ ඉංගිරිය අඩවි වන කාර්යාල යටතේ 2014 වර්ෂය සඳහා ලියා පදිංචි විය යුතු දැව ව්‍යාපාර 84 ක් ලියා පදිංචිය අලුත් කර නොතිබුණි. ඒ සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම නිසා රජයට රු. 114,810 ක අලාභයක් සිදු වි තිබුණි.

**(ඇ) හබරණ ත්‍රිකුණාමලය මාර්ගය දෙපස වන වගා ව්‍යාපෘතියක් සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ පෞද්ගලික සමාගමක් ඒකාබද්ධව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

සඳහා ප්‍රමාණවත් උත්සාහයක් ගෙන නොතිබුණි. එසේම එම සමාගම සමඟ ගිවිසුමකට එළඹීමටත් පෙර පැළ 50,000 ක් නිෂ්පාදනය කරමින් වෙනත් වැය විෂයයක් යටතේ රු.429,689 ක වියදම් කර තිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සළසා ගෙන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ යුතු වුවත්, වන සංරක්ෂක (වන විද්‍යා හා කළමනාකරණ) ගේ වාචික උපදෙස් පරිදි වනාන්තර ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රතිපාදන සළසා තිබුණු වැය විෂයෙන් අදාල වියදම් කර තිබුණි. මේ නිසා එම වැය විෂය යටතේ ක්‍රියාත්මක කළ යුතුව තිබුණු වනාන්තර ප්‍රතිස්ථාපනය කාර්යයන් ඉටු කිරීමට නොහැකිව තිබුණි.

## (ඇ) ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන අපහරණය කිරිම

2013 ජුනි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය පදනම කරගෙන දෙපාර්තමේන්තුවේ පැවැති ගර්හිත වාහන 26 ක් අපහරණය කිරීමට කටයුතු කර තිබුණි. එම වාහන තක්සේරු කිරීමේ කමිටුව විසින් ඉන් වාහන 14 ක් පමණක් අපහරණය කිරිමට නිර්දේශ කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඊට අමතරව වෙනත් වාහන 08 ක්ද ඇතුළත්ව වාහන 22 ක් අපහරණය කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i).** ලියාපදිංචිය අවලංගු කර විකිණීම සඳහා කමිටුව නිර්දේශ කළ වාහන පහෙන් ලියාපදිංචි කිරීමේ සහතිකවල පැවති අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නිර්දේශ කර තිබු වාහන තුනක්ද, වාහන විකිණීමේ දැන්වීමට ඇතුළත් කිරීම නිසා එක් වාහනයක් සඳහා රු.500 බැගින් ගැනුම්කරුවන් 114 ක් විසින් ගෙවා තිබු ආපසු නොගෙවන රු.57,000 ක තැන්පතු රජයේ ආදායමට බැර කර තිබුණි.

**(ii).** ඊට අමතරව එම ගැණුම්කරුවන් 114 ක් විසින් එක් වාහනයක් වෙනුවෙන් රු.5,000 ක් බැගින් එකතුව රු.570,000 ක ඇප තැන්පතුවලින් රු.70,000 ක් මාස 07 කට වැඩි කාලයක් ආපසු නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(iii).** ඇතැම් වාහන මිලදී ගැනිම සඳහා ඉදිරිපත් වු ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු මිල ගණන්වලට වාහන විකිණීම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණත්, ඔවුන් විසින් තැන්පත් කර තිබුණු රු.40,000 ක ඇප තැන්පතු 2014

නොවැම්බර් 13 දින වන විටත් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iv).** වාහන දෙකක් අදාල ගැණුම්කරුවන් විසින් මුදල් ගෙවා රැගෙන ගොස් තිබුණත්, එම වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරාදීමට 2014 නොවැම්බර් 13 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(v). 2014 අප්‍රේල් 04 දිනට විකුණා තිබුණු වාහන 12 න් වාහන 07 ක නීත්‍යානුකූලව පැවරීම සඳහා වු ඉල්ලුම්පත් සම්පූර්ණ කර පැවරුම්කරුගේ පිටපත ( MTA 6 ) මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවට බාර දී තිබුණත්, එකී වාහන 2014 නොවැම්බර් 13 දින වන විටත් නව අයිතිකරුවන් වෙත පවරාදීමට කටයුතු කර නොතිබුණි.

(vi). විකිණීම සඳහා ලංසු කැඳවා තිබුණු වාහනයකට ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු විසින් 2014 ජුලි 09 දින මුදල් ගෙවා තිබුණි. ඒ පිළිබඳව සොයා බැලීමකින් තොරව දෙවන ඉහළ මිල ගණන ඉදිරිපත් කර තිබුණු ලංසුකරු විසින් සඳහන් කර තිබුණු මිල ගණන ගෙවා වාහනය මිලදී ගැනිමට කටයුතු කරන ලෙස දැණුම් දි තිබුණු අතර, ඒ අනුව 2014 ජුලි 21 දින එම වාහනයට මුදල් ගෙවා තිබුණි. පසුව දෙවන ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වෙත නිකුත් කර තිබුණු මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය අවලංගු කර නැවත මුදල් ආපසු ගෙවා තිබුණි.

(vii). වාහන ගර්හිත කිරීම හා වටිනාකම තක්සේරු කිරීමේ කමිටුව විසින් ලියාපදිංචිය අවලංගු කර විකිණීම සඳහා නිර්දේශ කළ වාහන 07 ක් සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 13 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(viii). මීට අමතරව පාවිච්චියට ගත නොහැකිව දෙපානම පැළ තවානේ ගාල් කර තිබුණු වාහන 05 ක් 2014 නොවැම්බර් 13 දින වන විටත් ගාල් කර තිබුණි. එම වාහන සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ix).** තවද වාහන ගර්හිත කිරීම හා තක්සේරු කිරීමේ කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර නොතිබුණු වාහන 02 ක් දෙපානම පැළ තවානේ 2014 නොවැම්බර් 13 දින වන විටත් ගාල්කර තිබුණි.

**(x).** වාහනයක් මිලදී ගත් තැනැත්තෙකු විසින් දින 25 සැප්තැම්බර් 2014 රු.300,000 ක් ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඔහු වෙත නිකුත් කළ මුදල් භාරගැනීමේ කුවිතාන්සියෙහි භාරගත් මුදල රු.3,000,000 ක් ලෙස ඉලක්කමෙන් හා අකුරෙන් සඳහන් කළ වටිනාකම එකිනෙකට වෙනස් විය.

## 4.17 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 65 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 42 | 11 | 31 |
| (iii) | ද්විතියික මට්ටම | 1,383 | 1,109 | 274 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,609 | 1,022 | 587 |
| | **එකතුව** | **3,119** | **2207** | **912** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පුරප්පාඩු 912 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.